ශීර්ෂය 326 - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 326 - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූලි 31 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත්කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ, මහභාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව, මහභාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරබවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 01/2017 හා 2017 ජුනි 28 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 ඡේදයට අනුව එක් එක් ආයතනය විසින් මිලදීගන්නා සහ අපහරණය කරන වත්කම් සම්බන්ධයෙන් තොරතුරු අදාළ කාර්තුව අවසානයේදී කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට ඉදිරිපත් කළ යුතු වුවත්, ආකෘතිපත්‍ර ඒසීඒ - 6 අනුව සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය නොවන වත්කම් යටතේ යන්ත්‍ර හා උපකරණ ආරම්භක ශේෂයට රු.17,563,795ක වත්කම් එකතු කරතිබූ අතර, ඉන් රු.9,706,405ක වටිනාකමට අදාළ වත්කම් පිළිබඳ තොරතුරු පමණක් කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වර්ෂය තුළදී ඉදිරිපත්කර තිබුණි.	2024 වර්ෂයෙහි මිලදීගත් ඇඹිළි සළකුණු යන්ත්‍ර 05ක් හා UNODC ආයතනයෙන් ප්‍රදාන වශයෙන් ලද පරිගණක යන්ත්‍ර 50ක් සම්බන්ධ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත 2024 වර්ෂයේදී දැනුම්දී නොමැති බවත්, එම තොරතුරු මෙම වර්ෂයේදී යොමුකිරීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව වත්කම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.
(ii)	සමාලෝචිත වර්ෂයේදී UNODC ආයතනය විසින් දෙනු ලැබූ විදේශ ප්‍රදානවලින් ලද රු.19,968,568ක යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වර්ෂයේ දේපළ, පිරියත හා උපකරණවලට හා එම සංචිතයට ඇතුළත්කර නොතිබුණි.	2024 වර්ෂයේදී එම තොරතුරු ගිණුම්ගත කිරීමට නොහැකි වූ අතර, මේ වන විට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි UNODC ආයතනය මඟින් විදේශ ප්‍රදාන ලෙස ලබාදුන් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ CIGAS වැඩසටහනෙහි වත්කම් ලෙසට ඇතුළත් කිරීමට කටයුතුකර ඇති බව දන්වා තිබුණි.	වත්කම්වල නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය.

(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i) ඇප ලේඛනය		
මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙලකර නොතිබුණි.	ඇප තැබීමට අවශ්‍ය නිලධාරින් හඳුනාගෙන එම නිලධාරින්ගේ විස්තර සහ අදාළ ආකෘති සම්පූර්ණකර අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත 2025 මාර්තු 07 දින යොමුකර ඇති බව දන්වා තිබුණි.	මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරින් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු ය.
(ii) හානි පිළිබඳ ලේඛනය		
මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනකර නොතිබුණි.	අදාළ පරීක්ෂණ සිදුකර ඇතත්, ප්‍රමාද දෝෂයකින් හානි පාඩු ලේඛනයෙහි ඇතුළත් කිරීමට නොහැකි වූ අතර, මෙම වර්ෂයේදී එම තොරතුරු ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	මුදල් රෙගුලාසි 110හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතු ය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත්කර ගැනීම සඳහා රු.50,000,000ක් පරිපූරක ඇස්තමේන්තු මගින් වෙන්කර තිබූ අතර, ඉන් රු.34,578,585ක් උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම් පරිපූරක ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට 69ක් වී තිබුණි.	UNODC ආයතනය වෙතින් ප්‍රදානයක් වශයෙන් ලද පරිගණක යන්ත්‍රවල අදාළ දිනට පැවති සත්‍ය වටිනාකම හා ගෙවන ලද සත්‍ය බදු වියදම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා රේගුව වෙත යොමුකර, එම සත්‍ය වටිනාකම ගිණුම් තබා ඇති අතර, අවශ්‍ය ප්‍රමාණය ඉක්මවූ ප්‍රතිපාදන ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව වෙත වෙන්කිරීම සම්බන්ධව කිසිදු දැනුවත්වීමක් දෙපාර්තමේන්තුව සතු නොවන බවත් දන්වා තිබුණි.	නිසිඅධ්‍යයනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙළ කිරීමට කටයුතු කළ යුතු ය.
(ආ)	සමාලෝචිත වර්ෂය තුළ වැය විෂයයන් 14ක් සඳහා වෙන්කරන ලද රු.73,375,000ක ප්‍රතිපාදනවලින් රු.41,135,005ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. වැය විෂයයන්හි එසේ ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 11 සිට සියයට 90 අතර පරාසයක පැවතුණි.	රාජ්‍ය වියදම් පාලනය කිරීමේ අරමුණින් නිලධාරින්ගේ නිවාඩු දින පැමිණීම් හා අතිකාල සීමාකිරීම, විදේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ නිලධාරින්ට අනියම් දීමනාව පමණක් ගෙවීම, ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු හා මාසික ද්වීමාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් මාර්ගගත ක්‍රමයට සූම් තාක්ෂණය ඔස්සේ පැවැත්වීම, නිල ඇඳුම් දීමනාව ගෙවන නිලධාරින් ප්‍රමාණය අඩුවීම සහ මහාධිකරණ හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට ලබාදුන් ප්‍රතිපාදන ඒ ආකාරයෙන්ම භාවිතාකර නොමැතිවීම වැනි හේතූන් නිසා ප්‍රතිපාදන ඉතිරිවූ බව දන්වා තිබුණි.	නිසිඅධ්‍යයනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙළ කිරීමට කටයුතු කළ යුතු ය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 5ක් සඳහා මුදල් රෙගුලාසි 66 මගින් රු.1,705,000ක් මාරුකර තිබූ අතර, එලෙස මාරුකරගත් ප්‍රතිපාදන උපයෝජනය නොකර රු.451,765ක් එනම් සියයට 10 සිට සියයට 135 දක්වා	2024 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව මගින් ඉල්ලුම් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය ඒ අයුරින්ම නොලැබීම නිසා, මෙම වැය විෂයයන් සඳහා අදාළ කටයුතු කරගෙන යාමට අමතර ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 යටතේ	නිසිඅධ්‍යයනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙළ කිරීමට කටයුතු කළ යුතු ය.

	ඉතිරිවීම් තිබුණි.	මාරුකළ ද, ඉන් ප්‍රතිපාදන ප්‍රමාණයක් විවිධ හේතූන් නිසා ඉතිරි වූ බව දන්වා තිබුණි.	
(ඈ)	මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් සලසා ඇති ප්‍රතිපාදන සීමාවන් තුළම වියදම් කළමනාකරණයකර ගැනීමට කටයුතු කළ යුතු වුව ද, සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 4ක් සඳහා සලසා තිබුණු රු.6,100,000ක ප්‍රතිපාදනයන්ට අමතරව මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් අරමුණු සඳහා වෙන්කල රු.1,355,000ක ප්‍රතිපාදන මාරුකර තිබුණි. වැය විෂයයන් අතර එලෙස මාරුකිරීමේ ප්‍රතිශතය සියයට 9 සිට සියයට 39 අතර පරාසයක් ගෙන තිබුණි.	මෙම වැය විෂයයන් හතර සඳහා 2024 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව මගින් ඉල්ලුම් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය ඒ අයුරින්ම නොලැබීම නිසා මුදල් රෙගුලාසි 66 යටතේ අමතර ප්‍රතිපාදන මාරු කරගත් බව දන්වා තිබුණි.	නිසිඅධ්‍යයනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙළ කිරීමට කටයුතු කළ යුතු ය.
(ඉ)	මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කළ යුතු වුවත්, එසේ නොකිරීම හේතුවෙන් මුළු ශුද්ධ ප්‍රතිපාදනය හා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය අතර වෙනස ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට (63) සිට සියයට 3,653 අතර පරාසයක පැවතුණි.	2024 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු මගින් ඉල්ලුම් කරන ලද මුදල් ප්‍රමාණයම නොලැබීම සහ රාජ්‍ය වියදම් චක්‍රලේඛය අනුව වියදම් සීමාකිරීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ මුළු ශුද්ධ ප්‍රතිපාදනය හා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය අතර වෙනසක් ඇතිවූ බව දන්වා තිබුණි.	නිසිඅධ්‍යයනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙළ කිරීමට කටයුතු කළ යුතු ය.
(ඊ)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ආකෘති පත්‍ර ඒසීඒ-2(ii) හි මුදල් රෙගුලාසි 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් තීරුව යටතේ මුළු වියදම්වල එකතුව රු.44,476,921ක් වුව ද, එය රු.24,508,352ක් ලෙස සටහන්කර තිබුණි.	ආකෘතිපත්‍ර ඒසීඒ -2(ii) හි මුදල් රෙගුලාසි 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ මුළු වියදම්වල එකතුව ප්‍රමාද දෝෂයකින් රු.24,508,352ක් ලෙසට සටහන්ව තිබූ අතර, නැවත මෙවන් දෝෂ ඇති නොවන ලෙස කටයුතු කරන බව දන්වා තිබුණි.	නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය.

3.2 බැරකම් හා බැඳීම්වලට එළැඹීම

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
සමාලෝචිත වර්ෂයේ බැඳීම් හා බැරකම් ප්‍රකාශනයේ සහ භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (SA-92) තුළ ඇතුළත් නොවූ රු.662,647ක් වූ බැරකම් 2025 වර්ෂයේදී	2024 වර්ෂයට අදාළව 2025 ජනවාරි 31 දිනට පසුව ලද රු.662,647ක් වටිනා වවුචර්පත්‍ර බැරකම් ලෙස සිගාස් වැඩසටහනට	වර්ෂයට අදාළ බැඳීම් හා බැරකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු ය.

නිරවුල්කර තිබුණි.	ඇතුළත් කිරීමට නොහැකි වූ බව දන්වා තිබුණි.	

3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ ගණන්දීමේ නිලධාරි විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරි විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතුකර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සහ එම අධීක්ෂණ කටයුතු ගණකාධිකාරි විසින් සිදුකරගෙන යනු ලබන අතර, මේ වන විට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නිසිපරිදි අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ සහ ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරිගේ සහභාගීත්වයෙන් පවත්වන අතර, පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව සමාලෝචන රැස්වීම් පවත්වා ඇති බව දන්වා තිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම.
(ආ)	අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසිපරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු වුවත්, වාර්තාවේ 6.2 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණක තනතුරට නිලධාරියෙකු පත් කිරීමට ඉල්ලීම් කර ඇති බව දන්වා තිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම.

3.4 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීතිරීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

	නිරීක්ෂණය නීතිරීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**			
	1 වැනි කාණ්ඩය, V පරිච්ඡේදයේ 7.1 ඡේදය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති XV වැනි පරිච්ඡේදයේ 171 හා 172 වගන්ති	ආයතන සංග්‍රහයෙහි අදාළ වගන්ති ප්‍රකාරව, ආයතන ප්‍රධානී වෙත නොදන්වා රාජකාරියට වාර්තා නොකර සිටින නිලධාරියෙකු සිය තනතුර අතහැර ගියා සේ සලකා ඒ බැව් නිලධරයා වෙත ලියාපදිංචි තැපැලෙන් වහාම දන්වා යැවිය යුතු නමුත්, දෙපාර්තමේන්තුවෙහි නිලධාරින් හත්දෙනෙකු වෙත දෙපාර්තමේන්තුව විසින් තනතුර අත්හැරයාමේ ලිපි නිකුත්කිරීමට මාස 02 සිට අවුරුද්දට වැඩි කාලයක් ප්‍රමාදකර තිබුණි.	සංවර්ධන නිලධාරින්ගේ පැමිණීම පිටවීම සම්බන්ධයෙන් එම නිලධාරියා අනුයුක්තකර ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කටයුතු කළ යුතු වුවත්, මේ වන විට සංවර්ධන නිලධාරින්ගේ පැමිණීම පිටවීම සෑම මසකම 15 දිනට පෙර පළාත් ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරි වෙත එවන ලෙස සියලුම ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත්කර ඇති බව දන්වා ඇත.	යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
මු.රෙ. 110	වාහන දෙකකට සිදු වූ හානි පිළිබඳව හානි හා පාඩු පිළිබඳ ලේඛනයෙහි යාවත්කාලීනකර නොතිබුණි.	ප්‍රමාද දෝෂයකින් හානි පාඩු ලේඛනයෙහි ඇතුළත් කර නොමැති අතර, මෙම වර්ෂයේදී එම තොරතුරු ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	යොමුගත රෙගුලාසිය ප්‍රකාරව හානි හා පාඩු ලේඛනගත කිරීමට කටයුතු කළ යුතු ය.
(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ			
(i) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛයේ 2(1) ඡේදය	රාජ්‍ය සේවකයන් තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම ඇඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මගින් සනාථ කිරීම කළ යුතු වුවත්, 2024 ජුලි 08 දින සිට අගෝස්තු 13 දින දක්වා ප්‍රධාන කාර්යාලයේ සේවයට වාර්තා කළ නිලධාරියෙකු එසේ සිදුකර නොතිබුණි.	මේ වන විට ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත සියලුම නිලධාරින් ඇඟිලි සලකුණු යන්ත්‍රයේ පැමිණීම පිටවීම සළකුණු කරනු ලබන බව දන්වා තිබුණි.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව පැමිණීම හා පිටවීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළ යුතු ය.
(ii) 2022 සැප්තැම්බර් 15 දිනැති අංක 14/2022 දරන චක්‍රලේඛයේ (II)හි 4.14 ඡේදය	චක්‍රලේඛය ප්‍රකාරව පමණක් නිවාඩු අනුමත කිරීම කළ යුතු වුවත්, ඊට පටහැනිව රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි සේවය කළ නිලධාරියෙකුට විදේශ නිවාඩු අනුමතකර තිබූ අතර, අදාළ නිලධාරියා රාජකාරි ඉටුකරනු ලැබූ එම තනතුර සමාලෝචිත වර්ෂය තුළදී පුරප්පාඩුව පැවතීම හේතුවෙන් ආඥාලාභීන් පිළිබඳව කිසිදු කටයුත්තක් එම කාර්යාලය තුළින් සිදුවී නොතිබුණි.	මෙම ලේකම් කාර්යාලයේ රාජකාරි සඳහා ස්ථාන මාරු වී පැමිණි නිලධාරිනිය රත්මලාන ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් එම නිලධාරිනිය ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත කිරීමට සිදු වූ බවත්, අදාළ කාර්යාලයට මේ වන විට නිලධාරියෙකු අනුයුක්ත කර ඇතිබවත් දන්වා තිබුණි.	ප්‍රාදේශීය කාර්යාලවල සේවය සැපයීමට නිලධාරීන් යෙදවීමට කටයුතු කළ යුතුවීම.

3.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9.1 (ආ) පරිච්ඡේදයට සහ මුදල් රෙගුලාසි 371(5) අනුව අතුරු අග්‍රිමයක් නිකුත්කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන්කර දින 10ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුව ද, නිලධාරින් 33 දෙනෙකු විසින් අවස්ථා 51කදී ලබාගත් රු.1,320,840ක් වූ අතුරු අග්‍රිම පියවීමට දින 11 සිට 222 දක්වා කාලපරාසයක් ප්‍රමාදකර තිබුණි.	මින් ඉදිරියට මෙවැනි අවස්ථා සිදුනොවීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	ලබාගත් අත්තිකාරම් නියමිත දිනට පෙර පියවීමට කටයුතු කළ යුතු ය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව ලබා ගැනීමට සැලැසුම් කළ නියෝග 15,000කින් නියෝග 12,000ක් වර්ෂය තුළදී අවසන් කිරීමට සැලසුම් කළ ද, වර්ෂය තුළදී නියෝග 6,536ක් එනම් ඇස්තමේන්තු කළ ප්‍රමාණයෙන් සියයට 43ක් අවසන්කර තිබුණි.	ප්‍රජා විශෝධන නියෝග සඳහා යොමු කරන නියෝගලාභීන්ගෙන් 12,000ක ප්‍රමාණයක් අවසන් කිරීමට අපේක්ෂිතව තිබුණ ද, නියෝගයේ ස්වභාවය හා නියෝග කාලසීමාව නියෝගය නිකුත්කිරීමට අදාළව සිදුවන නිසාත්, අදාළ වර්ෂය තුළ සියලු නියෝග අවසන් නොවන නිසාත් එය ඉදිරි වර්ෂ වෙත ද ගෙන යාමට සිදුව ඇත. ඒ අනුව පනත ප්‍රකාරව මාස තුනේ සිට වසර 2ක් දක්වා කාලය තුළ නියෝග ක්‍රියාත්මක කිරීමට සිදුවන බව ද දන්වා තිබුණි.	සැලසුම් නිසියාකාරයෙන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය.

(ආ)	ප්‍රජා විශෝධන නියෝගයන්ට අදාළ කොන්දේසි සම්පූර්ණ කිරීම සඳහා වර්ෂය තුළ දී ක්‍රීඩා වැඩසටහන් 315ක් පැවැත්වීමට සැලසුම් කළ ද, වර්ෂය තුළ දී වැඩසටහන් 109ක් එනම් සියයට 34ක් පවත්වා තිබුණි.	2024 වර්ෂයේ දී අපේක්ෂිත ඉලක්කයට ළඟාවිය නොහැකි වුව ද, මෙම වැඩසටහන 2025 වර්ෂයෙහි ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්කර මාසිකව සහ කාර්තු වශයෙන් ප්‍රගතීන් සොයාබැලීම සිදුකරනු ලබන බව දන්වා තිබුණි.	සැලසුම් නිසියාකාරයෙන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ආඥාලාභී ශ්‍රමය යොදාගෙන ආදායම් උත්පාදන ව්‍යාපෘති 9ක් වර්ෂය තුළ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ ද, සත්‍ය වශයෙන් වර්ෂය තුළ දී වැඩසටහන් 03ක් පමණක් එනම් සියයට 33ක් පවත්වා තිබුණි.	ආඥාලාභීන්ගේ ශ්‍රමය යොදාගනිමින් ආදායම් උත්පාදන ව්‍යාපෘතීන් ආරම්භ කිරීමේ දී කෘෂිකාර්මික අංශයෙන් ආරම්භ කළ ව්‍යාපෘතිවල සාධනීය ප්‍රගතියක් නොමැති හෙයින් 2025 වර්ෂයට ප්‍රාදේශීය මට්ටමින් සුදුසු නව ව්‍යාපෘති (ලිපිකවර නිෂ්පාදනය) හඳුන්වාදීම සිදුකර ඇති බව දන්වා තිබුණි.	සැලසුම් නිසියාකාරයෙන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය.
(ඈ)	ක්‍රියාකාරී සැලස්මට ඇතුළත්කර නොතිබූ රු.209,858කට අදාළ කාර්යයන් 4ක් වර්ෂය තුළ දී ක්‍රියාත්මකකර තිබුණි.	මෙම කාර්යයන් හතරම අත්‍යාවශ්‍ය හා කල් දැමිය නොහැකි කටයුතු නිසා ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණ ද, ක්‍රියාත්මක කිරීමට සිදු වූ අතර, සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මට අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව වියදම් දරන ලද බව දන්වා තිබුණි.	සැලසුම් නිසියාකාරයෙන් සකස් කිරීමට කටයුතු කළ යුතු ය.
(ඉ)	ඇස්තමේන්තුව නිසියාකාරව පිළියෙළ නොකිරීම හේතුවෙන් වර්ෂය තුළ දී රු.300,000ක් වැයකර වෛරස් ගාඩ් 223ක් මිලදීගැනීමට සැලසුම් කළ ද, වර්ෂය තුළ දී රු.298,894ක් වැයකර වෛරස් ගාඩ් 170ක් පමණක් මිලදීගෙන තිබුණු අතර, රු.1,000,000ක් වැයකර ඇඹිළි සළකුණු යන්ත්‍ර 10ක් මිලදීගැනීමට සැලසුම් කළ ද, වර්ෂය තුළ දී රු.569,350ක් වැයකර ඇඹිළි සළකුණු යන්ත්‍ර 5ක් මිලදීගෙන තිබුණි. එමෙන්ම රු.500,000ක් ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදීගැනීමට වෙන්කළ ද, එය මිලදී ගැනීම සඳහා රු.913,320ක් වැයකර තිබුණි.	මෙම මිලදීගැනීම් සඳහා ඇස්තමේන්තු සකස්කළ ද ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය නොලැබීමත්, භාණ්ඩ මිලෙහි උච්ඡාවචනයත් හේතුවෙන් අපේක්ෂා කළ පරිදි භාණ්ඩ මිලදී ගැනීමට නොහැකි විය. සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබී ඇති අතර, අයවැය මඟින් වෙන්කරන ලද ප්‍රතිපාදන කළමනාකරණයකර දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය අනුව අදාළ භාණ්ඩ මිලදීගත් බව දන්වා තිබුණි.	සැලසුම් නිසියාකාරයෙන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය.

4.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
අනුරාධපුර, කැකිරාව විශෝධන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා වර්ෂය තුළදී රුපියල් මිලියනයක් ඇස්තමේන්තුකර තිබුණ ද, වර්ෂය තුළදී රු.64,215ක් වැයකර අදාළ ඉඩමෙහි මැනුම් කටයුතු පමණක් සිදුකර තිබුණි.	මේ වන විට ඉඩම් ස්ථිරව පැවරීමට අනුමැතිය ලැබී ඇති අතර, දැනට අදාළ ව්‍යාපෘතියේ ව්‍යාපෘති සැලසුම් වාර්තාව ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NPD) අනුමැතිය වෙත යොමුකර 2026 වර්ෂයට අදාළව ප්‍රතිපාදන වෙන්කර ගැනීමට නියමිත බව දන්වා තිබුණි.	ඉදිකිරීම් කටයුතු කාර්යක්ෂමවකර ගැනීමට කටයුතු කළ යුතු ය.

4.3 මුදල් නිදහස්කර තිබුණත් ප්‍රගතියක් ලබානොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
පුත්තලම අධිකරණයේ ප්‍රජා විශෝධන කාර්යාලය සඳහා ඉදිකරනු ලබන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුවේ 2010 වර්ෂයේ ප්‍රතිපාදන යටතේ අධිකරණ අමාත්‍යාංශය විසින් රු.1,009,934ක මුදල් වියදම්කර තිබුණ ද, ඉදිකිරීම් කටයුතු අවසන්කර නොතිබුණි.	2010 වර්ෂයේ මෙම ගොඩනැගිල්ලට අදාළව ප්‍රසම්පාදන කටයුතු, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සහ ගෙවීම් කටයුතු සියල්ල අධිකරණ අමාත්‍යාංශය විසින් සිදු කර ඇති අතර, 2013 ජුනි 26 හා 2014 ජූලි 08 දිනැතිව අතරමග නවතා ඇති කොටස නැවත කඩිනමින් සකස්කර ලබාදෙන ලෙස ලිඛිතව අමාත්‍යාංශය දැනුවත්කර ඇති නමුත් ඒ සඳහා මේ වන තෙක් පිළිතුරු ලැබී නොමැත. කෙසේ නමුත් නැවත වරක් මේ පිළිබඳව අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිඛිතව දැන්වීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කර ගැනීමට කටයුතු කළ යුතු ය.

4.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 දෙසැම්බර් 31 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018, මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශයෙහි 1.3.1 ප්‍රකාරව සෑම වාහනයක් සඳහාම වර්ෂ 05කට වරක් තක්සේරුවක් ලබාගැනීම අනිවාර්යය වුව ද, දෙපාර්තමේන්තුවේ වාහන 04ක් සඳහා එසේ තක්සේරුවක් ලබාගෙන නොතිබුණි.	දෙපාර්තමේන්තුව සතු වාහන 04 තක්සේරු කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරදෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව වෙත මේ වන විට දැනුම් දී ඇති බව දන්වා තිබුණි.	චක්‍රලේඛ ප්‍රකාරව වාහන තක්සේරු කිරීමට කටයුතු කළ යුතු ය.
(ආ)	යථෝක්ත මාර්ගෝපදේශයේ 2.3, 3.3.1 සහ 4.3 ඡේද ප්‍රකාරව සෑම වර්ෂ 05කට වරක්ම ඉඩම් හා ගොඩනැගිලි, කාර්යාල උපකරණ හා ගෘහභාණ්ඩ සහ පිරියත හා යන්ත්‍රෝපකරණ සඳහා නැවත තක්සේරුවක් සිදුකළ යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් එසේ කිරීමට කටයුතුකර නොතිබුණි.	මෙම වර්ෂයේදී එම තක්සේරු කටයුතු සිදුකිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	චක්‍රලේඛ ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීමට කටයුතු කළ යුතු ය.

4.5 රජයේ නිලධාරින් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
රජයේ නිලධාරින් ඇප තැබීම පිළිබඳව 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 9 වන ඡේදයේ සංශෝධිත මුදල් රෙගුලාසි 880 අනුව රජයේ නිලධාරින් ඇප තැබීම පිළිබඳව රාජ්‍ය මුදල් ආදියේ භාරකාරීත්වය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වූ වගකීම ගණන්දීමේ නිලධාරියා සතුව පවතින බැවින්, නියමිත නිලධාරින් විසින් ඇප තබන බවට වග බලාගැනීම කළ යුතු යැයි සඳහන්කර තිබුණ ද, මුදල් රෙගුලාසි 315හි ඇප තැන්පත් කළ යුතු ගණකාධිකාරී, මුදල්	ඇප තැබීමට අවශ්‍ය නිලධාරින් හඳුනාගෙන එම නිලධාරින්ගේ විස්තර සහ අදාළ ආකෘති සම්පූර්ණ කර අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත 2025 මාර්තු 07 දින යොමුකර ඇති බව දන්වා තිබුණි.	චක්‍රලේඛය ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් ඇප තැබීමට කටයුතු කළ යුතු ය.

අයකැමි හා ගබඩා භාරකරු වැනි තනතුරු දරන නිලධාරින් අදාළ ඇප මුදල් තැන්පත්කර නොතිබුණි.

4.6 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
පුත්තලම අධිකරණ පරිශ්‍රයේ කාමරයක් තුළ පවත්වා ගෙන ගිය ප්‍රජා විශෝධන කාර්යාලයේ 2022 ජුනි 21 දින ඇති වූ හදිසි ගින්නකින් එම කාර්යාලයේ තිබූ පිරිවැය රු.163,302ක් වූ කාර්යාල උපකරණ සම්පූර්ණයෙන් විනාශ වී ගොස් තිබූ අතර, ඒ පිළිබඳව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත්හැරීම් පිළිබඳ ලේඛනයේ සඳහන්කර නොතිබුණි.	2022 ජුනි 21 දින පුත්තලම ප්‍රජා විශෝධන කාර්යාලය ගිනිගෙන විනාශ වූ අතර, එම ගිනිගැනීමට අදාළ පරීක්ෂණ කටයුතු සමාලෝචිත වර්ෂය තුළ අවසන්ව නොතිබූ බැවින්, ඒ පිළිබඳව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත්හැරීම් පිළිබඳ ලේඛනයේ සඳහන් නොකළ බව දන්වා තිබුණි.	මූල්‍ය ප්‍රකාශනවල අදාළ තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය.

4.7 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රජා විශෝධන නිලධාරියකු 2019 ඔක්තෝබර් 01 සිට 2023 අගෝස්තු 14 දින දක්වා විදේශ රැකියාවක් සඳහා නිවාඩු ලබා තිබූ අතර, මෙම නිලධාරියාගේ නිවාඩු කාලය අවසන් වී තිබුණ ද, 2023 අගෝස්තු 15 දින සේවයට වාර්තාකර නොතිබුණි. මෙම නිලධාරියාට එදින සිට සේවය අතහැර යාමේ නිවේදනය 2024 ජුනි 04 දින නිකුත්කර තිබුණ ද, ගිවිසුම් ප්‍රකාරව ඔහුගෙන් අයකරගත යුතු වූ රු.1,106,560ක දණ්ඩන මුදල අයකර ගැනීමට මේ දක්වා කටයුතුකර නොතිබුණි.	මෙම නිලධාරියාගේ ස්ථිර පදිංචියක් සොයා ගැනීමට නොහැකි වී ඇති බැවින්, ඔහු පිළිබඳව නීතිමය කටයුතු කිරීම සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇති අතර, ඉදිරි කටයුතු එම දෙපාර්තමේන්තුව විසින් සිදුකර ගෙන යනු ලබන බව දන්වා තිබුණි.	අදාළ දණ්ඩන මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.

(ආ)	ප්‍රාදේශීය කාර්යාලවල සේවය කරනු ලබන නිලධාරින්ගේ සේවයට පැමිණීම, පිටවීම හා නිවාඩු සම්බන්ධ පරිපාලන කටයුතු දෙපාර්තමේන්තුව විසින් මනා ලෙස කළමනාකරණය නොකිරීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරින් 04දෙනෙකු නොදන්වා සේවයට නොපැමිණිය ද රු.200,724ක මුදලක් වැටුප් ලෙස එම නිලධාරින්ට ගෙවා තිබූ අතර, එම මුදල් සමාලෝචිත වර්ෂය තුළදී අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.	රජයට අයවිය යුතු මුදල් ගෙවීමට කටයුතු කරන ලෙස මේ වන විට අදාළ නිලධාරින්ට දැනුම් දී ඇතිබව දන්වා තිබුණි.	ප්‍රාදේශීය කාර්යාලවල සේවය කරනු ලබන නිලධාරින්ගේ පරිපාලන කටයුතු මනා ලෙස කළමනාකරණය කළ යුතු ය.
(ඇ)	පුත්තලම අධිකරණයේ ප්‍රජා විශෝධන කාර්යාලය 2022 ජුනි මාසයේ හදිසියේ ඇති වූ ගින්නකින් විනාශ වූ අතර, කාර්යාලයේ තිබූ පරිගණක යන්ත්‍රය හා එහි සියලු කොටස්, ඡායා පිටපත් යන්ත්‍රය, ඇඟිලි සළකුණු යන්ත්‍රය හා අනෙකුත් කාර්යාල උපකරණ සම්පූර්ණයෙන් විනාශ වී ගොස් තිබුණ ද, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී ද, ඒ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු ආරම්භකර නොතිබුණි.	මෙම සිද්ධියට අදාළව පවතින නඩුවේ තීරණය ලැබෙන තෙක් තීරණයක් ලබාදිය නොහැකි බවට අමාත්‍යාංශ ලේකම් විසින් දන්වා ඇති අතර, ඒ අනුව මෙම සිද්ධියට අදාළ විමර්ශන කටයුතු සමාලෝචිත වර්ෂයෙහි සිදුකර ඇති බව දන්වා තිබුණි.	විමර්ශන කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතු ය.
(ඈ)	දෙපාර්තමේන්තුව විසින්, විනාශ වූ ස්ථානය වෙනුවට වෙනත් තාවකාලික ස්ථානයක් සොයා ගැනීමට හෝ අඩක් ඉදිකරන ලද ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු අවසන්කර ගැනීමට කටයුතුකර නොතිබුණි.	දෙපාර්තමේන්තු විගණන කළමනාකරණ කමිටු රැස්වීමේ යෝජනා අනුව මෙම කාර්යාලය ස්ථාපිත කිරීමට සුදුසු ස්ථානයක් ලබාදෙන ලෙස අධිකරණ අමාත්‍යාංශය හා පුත්තලම මහේස්ත්‍රාත් අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාට කිහිප අවස්ථාවක් දැනුවත්කර ඇති අතර එහි නඩු කටයුතු අවසන් වන තෙක් ඉදිරි ක්‍රියා මාර්ග ගත නොහැකි බව දන්වා තිබුණි.	වෙනත් ස්ථානයක් සොයාගැනීමට හෝ ඉදිකිරීම් කටයුතු අවසන් කර ගැනීමට කටයුතු කළ යුතු ය.

5. තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා තිරසර අරමුණක් හඳුනාගෙන තිබූ අතර, එම අරමුණ ඉටුකර ගැනීම සඳහා ඉලක්ක තුනක් පිළියෙලකර තිබුණි. මින් සුළු වැරදි සඳහා වැරදිකරුවන් වී ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමු කරනු ලබන පුද්ගලයන්ගෙන් සියයට 40ක ප්‍රමාණයක් ප්‍රජා විශෝධන ක්‍රියාවලිය තුළින් යහපත් පුද්ගලයන් බවට පත්කිරීම ඉලක්කකර තිබුණ ද, එහි ප්‍රගතිය සියයට 44ක මට්ටමක පැවති අතර, මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදකරුවන් සඳහා මත්ප්‍රතිකාර කිරීම තුළින් ඉන් සියයට 35- 40ක ප්‍රමාණයක් මුදවාගැනීමට අරමුණුකර තිබුණ ද, එය සියයට 29ක් පමණ අඩු මට්ටමක පැවතුණි. එසේම ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමුකරනු ලබන පුද්ගලයන්ගේ සමාජ යහපැවැත්ම තහවුරු කිරීම සඳහා සාමාජීය, ආර්ථික හා අධ්‍යාත්මික වශයෙන් නඟා සිටුවීම අරමුණුකර තිබුණ ද, එම අරමුණ කරා ළඟාවීමේ ඉලක්ක හඳුනාගෙන නොතිබුණි.	මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමිකතා සහිත වැරදිකරුවන් ප්‍රතිකාරාත්මක ක්‍රියාවලියට වඩා විධිමත් කරවීම සඳහා 2024 වර්ෂයේ දී ප්‍රතිකාර සඳහා යොමුකිරීමට පෙර මත්ද්‍රව්‍ය භාවිත මට්ටම් හඳුනාගැනීම සඳහා Asist ක්‍රමවේදය භාවිතා කිරීම ආරම්භකර නිලධාරින් ඒ සඳහා පුහුණුකර ඇති අතර, විශේෂයෙන් මත්ද්‍රව්‍ය භාවිත වැරදිකරුවන්ගේ ප්‍රතිකාරාත්මක විශෝධන ක්‍රියාවලියේ ප්‍රගතිය මැනබැලීම සඳහා නියෝගලාභී අත්පොතක් හඳුන්වාදීමට ද කටයුතුකර ඇතිබව දන්වා තිබුණි.	තිරසර අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කළ යුතු ය.

6. යහපාලනය

6.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුව පිළිබඳව තොරතුරු බාහිර පාර්ශ්වයන්ට ලබාගැනීමට වෙබ් අඩවියක් නිර්මාණය කර තිබුණ ද, එය සමාලෝචිත වර්ෂය තුළදී යාවත්කාලීනකර නොතිබුණි.	කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අංශය සමග සම්බන්ධ වී වෙබ් අඩවිය නිර්මාණය කිරීම සඳහා මූලික කටයුතු සිදුකර ඇති බව දන්වා තිබුණි.	කඩිනමින් වෙබ් අඩවිය යාවත්කාලීනකර ගැනීමට කටයුතු කළ යුතු ය.

6.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(i) වගන්තියට අනුව දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණන තනතුරක් මේවන විට අනුමතකර ඇති නමුත් මේ දක්වා එම තනතුර සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III නිලධාරියෙකු රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් අනුයක්තකර නොමැති බැවින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට නොහැකි වී ඇති බව දන්වා තිබුණි.	විගණන පනතට අනුකූලව කටයුතු කළ යුතු ය.

7. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඵලදායී සේවා මට්ටමක් පවත්වා ගැනීමට හා සේවක සංඛ්‍යාව පිළිබඳව කාලීන සමාලෝචනයක් කිරීමට නොහැකිවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03ක්, තෘතියික මට්ටමේ පුරප්පාඩු 18ක්, ද්විතීක මට්ටමේ පුරප්පාඩු 40ක් සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 03ක් ද ඇතුලුව සමස්ත පුරප්පාඩු 64ක් පැවතුණි.	ජ්‍යෙෂ්ඨ මට්ටම, කාර්යාල කාර්යය සහායක සහ භාෂා පරිවර්තක පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා misco පද්ධතිය මඟින් ඉල්ලීම්කර ඇති අතර සහකාර කොමසාරිස් තනතුර සඳහා සුදුසුකම් සපුරන ලද නිලධාරින් මේ වන විට නොමැති බවත්,ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරි තනතුර සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි බඳවා ගැනීමට කටයුතු කරමින් පවතින අතර, අනෙකුත් ප්‍රජා විශෝධන නිලධාරි තනතුරු 13 ක පුරප්පාඩු පිරවීම සඳහා බඳවා ගැනීමේ ගැසට් නිවේදනය නිකුත් කිරීම අවශ්‍ය කටයුතු කරමින් පවතී. එමෙන්ම ද්විතීයික මට්ටමේ කනතුරු 40 සඳහා බඳවාගැනීමට සමාලෝචන මණ්ඩලයට අනුමැතිය සඳහා ඉදිරිපත්කර ඇති බව දන්වා තිබුණි.	ආයතනයේ අරමුණු හා ප්‍රධාන කාර්යයන් ඵලදායීව ඉටුකිරීම සඳහා අදාළ තනතුරුවලට බඳවාගැනීමට කටයුතු කළ යුතු ය.

(ආ)	ද්විතියික මට්ටමට අයත් ප්‍රජා විශෝධන නිලධාරි සහ වැඩ පරීක්ෂක තනතුරු 30ක පමණ පුරප්පාඩු පැවතීම හේතුවෙන් ප්‍රාදේශීය විශෝධන කාර්යාල නිසිපරිදි ක්‍රියාත්මක නොවීම මත ආයතනයේ ප්‍රධාන කාර්යයභාරය වන ආඥාලාභීන් විශෝධනය කිරීමේ කටයුතුවලට එය බාධාවක් වී තිබුණි.	දැනට රාජකාරී ආවරණය සඳහා නිලධාරින් යොදවා ඇති බවත්, ඉදිරියේදී ප්‍රජා විශෝධන නිලධාරින් 13ක් හා වැඩපරීක්ෂක නිලධාරින් 13ක් බඳවාගැනීමට කටයුතු කරන බවත්, එමඟින් දැනට පුරප්පාඩුව පවතින කාර්යාල සඳහා නිලධාරින් අනුයුක්ත කිරීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි.	ආයතනයේ අරමුණු හා ප්‍රධාන කාර්යයන් ඵලදායීව ඉටුකිරීම සඳහා අදාළ තනතුරුවලට බඳවාගැනීමට කටයුතු කළ යුතු ය.